සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

61 S I

# පළමු වාර පරීක්ෂණය - 10 ශ්‍රේණිය - 2020
# First Term Test - Grade 10 - 2020

නම/විභාග අංකය : ................................................ භූගෝල විද්‍යාව - I කාලය : පැය 03 යි.

✳ ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න. මෙම පත්‍රය සඳහා ලකුණු 40ක් හිමි වේ.
✳ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති උපදෙස්වලට අනුකූලව සියලු ම ප්‍රශ්නවලට මෙම ප්‍රශ්න පත්‍රයේ ම පිළිතුරු සපයන්න.

✳ **ප්‍රශ්න අංක 01 සිට 10 තෙක් දී ඇති ප්‍රශ්නවල එක් එක් හිස්තැනට ගැළපෙන පිළිතුර වරහන් තුළින් තෝරා තිත් ඉර මත ලියන්න.**

(01) පෘථිවි තලයේ මතු පිට වර්ග ප්‍රමාණය වර්ග කිලෝමීටර් .............................................................. කි.
(මිලියන 570 / මිලියන 510 / මිලියන 120)

(02) පෘථිවි පද්ධතිය උප පද්ධති .............................................................. සමන්විත වේ.
(හතරකින් / තුනකින් / පහකින්)

(03) වායුගෝලයේ අඩුම උෂ්ණත්වයක් පවතින්නේ .............................................................. ගෝලයේ ය.
(පරිවර්තී / අපරවර්තී / මෙසෝ)

(04) වර්ෂණය මගින් පෘථිවිය මතට ලැබෙන ජලයෙන් කොටසක් භූමිය මතුපිට ගලා යාම .............................................................. ලෙස හැඳින්වේ.
(කාන්දු වීම / අපධාවය / ඝනීභවනය)

(05) පෘථිවි කබොලේ මහාද්වීපික කොටස .............................................................. පාෂාණවලින් බහුල කලාපයකි.
(සිලිකා / ග්‍රැනයිට් / මැග්නීසියම්)

(06) මැඩගස්කර දූපත ................................................ මහද්වීපික තටකය තුළ පිහිටා ඇත.
(අප්‍රිකා / ආසියා / ඕස්ට්‍රේලියා)

(07) පෘථිවි ව්‍යුහයට අනුව ගුටෙන්බර්ග් අසන්තතිය දෙපස .............................................................. යන ස්තර පිහිටා ඇත.
(ප්‍රාවරණය හා හරය / කබොල සහ ප්‍රාවරණය / පිටත හරය හා ඇතුලත හරය)

(08) ගැඹුරු සාගරයේ යමහල් ක්‍රියාකාරීත්වය මගින් ඇති වූ දූපතකට නිදසුනක් ලෙස .............................................................. දූපත දැක්විය හැක.
(හවායි / ජපන් / තස්මේනියා)

(09) හිමාලය කඳු පන්තියේ පිහිටා ඇති .............................................................. සානුව මුහුදු මට්ටමේ සිට වඩාත් උසින් පිහිටා ඇති සානුවකි.
(පාමීර් / ටිබෙට් / මොංගෝලියානු)

(10) ලෝකයේ ගැඹුරුම සාගරික අගාධය ........................................... සාගරයේ පිහිටා ඇත.
(අත්ලාන්තික් / ඉන්දියන් / පැසිපික්)

✳ **අංක 11 සිට 15 තෙක් දී ඇති එක් එක් ප්‍රකාශය කියවා බලා එය නිවැරදි නම් 'නි' යන්න වටා ද වැරදි නම් 'වැ' යන්න වටා ද රවුමක් අඳින්න.**

(11) පෘථිවි තලයෙන් 71%ක් ම සාගරයෙන් වැසී පවතී. ( නි /වැ )

(12) පෘථිවි කබොලේ සිමා ස්ථරය දරා සිටින මූලික පාෂාණ ස්තරය සියල් ස්තරයයි. ( නි /වැ )

(13) කෙටි කාලයක් තුළ වායුගෝලයේ පවත්නා සාමාන්‍ය තත්ත්වය දේශගුණයයි. ( නි /වැ )

(14) ගුරුත්ව බලය නිසා වායුගෝලය පෘථිවිය හා බැඳී පවතී. ( නි /වැ )

(15) පෘථිවිය ඇතුළත හරය ද්‍රවමය ලෝහවලින් සමන්විත වේ. ( නි /වැ )

✳ **ප්‍රශ්න අංක 16 සිට 20 දක්වා දී ඇති ප්‍රශ්නවල 'අ' සහ 'ආ' යනුවෙන් තීරු දෙකක් දැක්වේ. ඒවායේ සම්බන්ධතාව අනුව ගැළපූ විට ලැබෙන පිළිතුරට හිමි අංකය තිත් ඉර මත ලියා දක්වන්න.**

(16) ලෝකයේ පිහිටි විල් කිහිපයක නම් 'අ' තීරුවේ ද ඒවා පිහිටි මහාද්වීප 'ආ' තීරුවේ ද දැක්වේ. 'අ' තීරුවේ අනුපිළිවෙළට 'ආ' තීරුව ගැළපූ විට ලැබෙන නිවැරදි පිළිතුර තෝරන්න.

| 'අ' තීරුව | 'ආ' තීරුව |
|---|---|
| 1. ඊරිවිල | A. අප්‍රිකා මහාද්වීපය |
| 2. අයර් විල | B. උතුරු ඇමරිකා මහාද්වීපය |
| 3. ටිටිකාකා විල | C. ඕස්ට්‍රේලියා මහාද්වීපය |
| 4. වික්ටෝරියා විල | D. දකුණු ඇමරිකා මහාද්වීපය |

(1) C, D, B, A (2) B, C, D, A (3) C, B, D, A (4) B, C, A, D (............)

(17) පෘථිවි වායුගෝලයේ ස්තර 'අ' තීරුවේ ද ඒවායේ විශේෂ ලක්ෂණ 'ආ' තීරුවෙන් ද දැක්වේ. ඒවා නිවැරදිව ගැළපූ විට ලැබෙන පිළිතුර තෝරන්න.

| 'අ' තීරුව | 'ආ' තීරුව |
|---|---|
| 1. පරිවර්තිගෝලය | A. ඕසෝන් වායු ස්තරය පිහිටා ඇත. |
| 2. අපරවර්තිගෝලය | B. උෂ්ණත්වය ඉතා අධිකයි. |
| 3. මෙසෝගෝලය | C. කාලගුණික සංසිද්ධීන් ඇතිවේ. |
| 4. තාපගෝලය | D. ජල වාෂ්ප හා වළාකුළු නැත. |

(1) C, A, B, D (2) B, C, A, D (3) A, D, C, B (4) C, A, D, B (............)

(18) ලෝකයේ ගංගා කිහිපයක නම් 'අ' තීරුවේ ද ඒවා ආරම්භ වන විවිධ ක්‍රම 'ආ' තීරුවේ දැක්වේ. ඒවා නිවැරදිව ගැළපූ විට ලැබෙන පිළිතුර තෝරන්න.

| 'අ' තීරුව | 'ආ' තීරුව |
|---|---|
| 1. නයිල් ගඟ | A. විලකින් |
| 2. රයින් ගඟ | B. උල්පතකින් |
| 3. තේම්ස් ගඟ | C. කඳුකරයේ උල්පතකින් |
| 4. මහවැලි ගඟ | D. ග්ලැසියර් දිය වූ ජලයෙන් |

(1) A, D, B, C (2) C, A, B, D (3) B, A, D, C (4) C, D, B, A (............)

(19) ලෝකයේ සාගර කිහිපයක නම් 'අ' තීරුවේ ද ඒවා පිහිටි මුහුදු කිහිපයක නම් 'ආ' තීරුවේ ද දැක්වේ. ඒවා නිවැරදිව ගැළපූ විට ලැබෙන පිළිතුර තෝරන්න.

| 'අ' තීරුව | 'ආ' තීරුව |
|---|---|
| 1. පැසිපික් සාගරය | A. කාරා මුහුද |
| 2. ඉන්දියන් සාගරය | B. කැරිබියන් මුහුද |
| 3. අත්ලාන්තික් සාගරය | C. ජපන් මුහුද |
| 4. ආක්ටික් සාගරය | D. අරාබි මුහුද |


(1) A, C, D, B (2) C, B, D, A (3) C, D, B, A (4) B, C, A, D (............)

(20) ලෝකයේ පිහිටි කඳුවැටි කිහිපයක නම් 'අ' තීරුවේ ද ඒවා අයත් මහාද්වීප 'ආ' තීරුවේ ද දැක්වේ. නිවැරදිව ගැළපූ විට ලැබෙන පිළිතුර තෝරන්න.

| 'අ' තීරුව | 'ආ' තීරුව |
|---|---|
| 1. අන්දීස් කඳුවැටිය | A. ඕස්ට්‍රේලියා මහාද්වීපය |
| 2. ඇල්ප්ස් කඳුවැටිය | B. අප්‍රිකා මහාද්වීපය |
| 3. ඇට්ලස් කඳුවැටිය | C. යුරෝපා මහාද්වීපය |
| 4. මහා බාධක කඳුවැටිය | D. දකුණු ඇමරිකා මහාද්වීපය |

(1) D, A, B, C (2) B, D, C, A (3) D, C, B, A (4) A, C, B, D (............)

✳ **අංක 21 සිට 25 දක්වා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා පහත තැටි මායිම් දැක්වෙන ලෝක සිතියම යොදා ගන්න.**




(21) යුරේෂියානු තැටිය දැක්වෙන්නේ .................................... අක්ෂරයෙනි.

(22) අප්‍රිකානු තැටිය දැක්වෙන අක්ෂරය ............................. වේ.

(23) සාගරික තැටියක් දැක්වෙන අක්ෂරය .................................. වේ.

(24) සුලු තැටියක් වන කොකෝස් තැටිය දැක්වෙන්නේ ............................ අක්ෂරයෙනි.

(25) ශ්‍රී ලංකාව අයත් වන්නේ ........................... අක්ෂරයෙන් දැක්වෙන භූ තැටියට ය.

✳ **අංක 26 සිට 30 දක්වා අසා ඇති ප්‍රශ්නවල හිස්තැනට සුදුසු වචනය යොදා සම්පූර්ණ කරන්න.**

(26) ගොඩබිම පිහිටි ජලය පිරි ආවාට .................................... ලෙස හැඳින්වේ.

(27) භූතලය සහ ජල තල මත ඇති ජලය ............................. මගින් වායුගෝලයට එකතු වේ.

(28) සාගර ජල තලයෙන් ඉහළට නැගුණ විශාල භූමි ස්කන්ධ .................................. නමින් හඳුන්වයි.

(29) පෘථිවි කබොල සහ ප්‍රාවරණයේ ඉහළ කොටස් ඇතුළත් කලාපය ............................ ලෙස හැඳින්වේ.

(30) උන්නතාංශය අනුව ඉහළ යන සෑම මීටර් 1000කට ම $6.4^{0}C$ බැගින් උෂ්ණත්වය අඩු වීම සිදු වන්නේ .......................... ගෝලය තුළයි.

✳ **අංක 31 සිට 40 දක්වා අසා ඇති එක් එක් ප්‍රශ්නයට දී ඇති පිළිතුරු අතරින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරා ඊට හිමි අංකය ඉර මත ලියා දක්වන්න.**

(31) පෘථිවියේ ජල ව්‍යාප්තියට අනුව සාගර හා මුහුදුවලට අයත් ජල ප්‍රමාණය මින් කවරක් ද?
(1) 2.5% (2) 79%
(3) 97.5% (4) 29% (............)

(32) පෘථිවි තලයේ ජල ව්‍යාප්තියට අනුව භූතල ජලය වැඩි ප්‍රමාණයක් දැකිය හැක්කේ කුමන ස්ථානයක ද?
(1) ගංගා ජලය (2) පාංශු ජලය
(3) විල් ජලය (4) ජල වාෂ්ප (............)

(33) ජෛව ගෝලයේ ක්‍රියාකාරීත්වය සඳහා බලපාන අජීවී සාධකය වන්නේ මින් කවරක් ද?
(1) ශාක (2) පස
(3) සතුන් (4) වියෝජකයන් (............)

(34) වායුගෝලයේ සංයුතිය අනුව වැඩි ම වායු ප්‍රමාණයක් පවතින වායුව කුමක් ද?
(1) හයිඩ්‍රජන් (2) ඔක්සිජන්
(3) ආගන් (4) නයිට්‍රජන් (............)

(35) පෘථිවි ව්‍යුහයට අනුව ඝනත්වය වැඩිම ස්ථරය කුමක් ද?
(1) පහළ ප්‍රාවරණය (2) ඉහළ ප්‍රාවරණය
(3) පිටත හරය (4) ඇතුළත හරය (............)

(36) මහාද්වීපවල විශාලත්වය අවරෝහණ පිළිවෙළට පෙළ ගැස්සූ විට ලැබෙන නිවැරදි පිළිතුර වන්නේ,
(1) ආසියා, අප්‍රිකා, යුරෝපා (2) අප්‍රිකා, ආසියා, යුරෝපා
(3) ආසියා, අප්‍රිකා, උතුරු ඇමරිකා (4) උතුරු ඇමරිකා, ආසියා, අප්‍රිකා (............)

(37) ආසියා මහාද්වීප තටකය තුළ පිහිටි දූපතක් වන්නේ පහත ඒවා අතරින් කුමක් ද?
(1) කියුබාව (2) තස්මේනියාව
(3) බෝර්නියෝ (4) පැපුවා නිව්ගිනියාව (............)

(38) ශ්‍රී ලංකාවේ පිහිටි සානු ප්‍රදේශයක් නොවන්නේ මින් කවරක් ද?
(1) හැටන් සානුව (2) වැලිමඩ සානුව
(3) කොස්ලන්ද සානුව (4) හපුතලේ සානුව (............)

(39) පහත සඳහන් තැනි ප්‍රදේශ අතුරින් ඕස්ට්‍රේලියාවේ පිහිටි තැනි ප්‍රදේශය කුමක් ද?
(1) සයිබීරියානු තැන්න (2) නල්ලබාර් තැන්න
(3) මැන්චූරියානු තැන්න (4) හෝර්ටන් තැන්න (............)

(40) ශීත දේශගුණයක් පවතින ප්‍රදේශවල වාර්ෂික වර්ෂාපතනය වන්නේ මින් කවර ප්‍රමාණයක් ද?
(1) 250 mm - 300 mm (2) 500 mm - 100 mm
(3) 1250 mm - 2000 mm (4) 2000 mm - 5460 mm (............)

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

61 S II

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education

## පළමු වාර පරීක්ෂණය - 10 ශ්‍රේණිය - 2020


## First Term Test - Grade 10 - 2020

නම/විභාග අංකය : ............................................... භූගෝල විද්‍යාව - II

- ✳ මෙම ප්‍රශ්න පත්‍රය I, II වශයෙන් කොටස් දෙකකි.
- ✳ I කොටසේ පළමු වන ප්‍රශ්නය අනිවාර්ය වේ.
- ✳ II කොටසින් ප්‍රශ්න **හතරකට** පමණක් පිළිතුරු සපයන්න. පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව පහකි.

## I කොටස

(01) (අ) පහත දැක්වෙන 1 : 50, 000 හූ ලක්ෂණ සිතියම් ආකෘතිය පිළිබඳ ඔබේ දැනුම භාවිත කොට පහත දැක්වෙන ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.




(i) A හා B අක්ෂරවලින් දැක්වෙන තීරු හඳුන්වන නම් පිළිවෙළින් ලියන්න. (ලකුණු 02)


(ii) C වලින් දැක්වෙන ප්‍රදේශය කුමක් ද? (ලකුණු 02)

(iii) A තීරුවේ සඳහන් වන තොරතුරු 2ක් ලියන්න. (ලකුණු 02)

(iv) අංක 1 හා 2න් දැක්වෙන ස්ථානයේ පවතින තොරතුරු මොනවා දැයි පිලිවෙළින් ලියන්න. (ලකුණු 02)

(iv) සිතියමක අන්තර්ගත තොරතුරු නිවැරදිව තේරුම් ගැනීමට දිශාව උපකාරී වේ. 1:50,000 හූ ලක්ෂණ සිතියම්වල උතුරු දිශාව දැක්වෙන ක්‍රම දෙකක් ලියන්න. (ලකුණු 02)

(ආ) ඔබ වෙත සපයා ඇති ලෝක සිතියම හොඳින් අධ්‍යයනය කොට පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.




(i) සිතියමේ ලකුණු කොට ඇති A, B, C යන කඳුවැටි අතරින් රොකී කඳුවැටිය දැක්වෙන අක්ෂරය කුමක් ද?

(ii) සිතියමේ ලකුණු කොට ඇති D, E, F අක්ෂරවලින් බයිකල් විල දැක්වෙන අක්ෂරය කුමක් ද?

(iii) සිතියමේ ලකුණු කොට ඇති G, H, J අක්ෂරවලින් නයිල් ගඟ දැක්වෙන අක්ෂරය කුමක් ද?

(iv) සිතියමේ ලකුණු කොට ඇති K, L, M අක්ෂරවලින් කහ මුහුද දැක්වෙන අක්ෂරය කුමක් ද?

(v) සිතියමේ ලකුණු කොට ඇති P, Q, R අක්ෂරවලින් බ්‍රිතාන්‍යය දූපත් දැක්වෙන අක්ෂරය කුමක් ද?

(ලකුණු 05)

(ඉ) ඔබ වෙත සපයා ඇති ශ්‍රී ලංකා සිතියම හොඳින් අධ්‍යයනය කොට පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(i) සිතියමේ ලකුණු කොට ඇති A, B, C අක්ෂරවලින් ලුණුවිල පොල් පර්යේෂණ ආයතනය පිහිටි දිස්ත්‍රික්කය දැක්වෙන අක්ෂරය කුමක් ද?


(ii) සිතියමේ ලකුණු කොට ඇති D, E, F අක්ෂරවලින් කොඩ්ඩියාර් බෙක්ක දැක්වෙන අක්ෂරය කුමක් ද?

(iii) සිතියමේ ලකුණු කොට ඇති G, H, J අක්ෂරවලින් වළවේ ගඟ දැක්වෙන අක්ෂරය කුමක් ද?

(iv) සිතියමේ ලකුණු කොට ඇති K,L, M අක්ෂරවලින් දෙවන වැඩිම ජනගහනයක් ඇති ගම්පහ දිස්ත්‍රික්කය දැක්වෙන අක්ෂරය කුමක් ද?


(v) සිතියමේ ලකුණු කොට ඇති P, Q, R අක්ෂරවලින් මාගම්පුර වරාය දැක්වෙන අක්ෂරය කුමක් ද?

(ලකුණු 05)




## II කොටස

(02) පහත දැක්වෙන්නේ ශිලාගෝලයට අයත් රූප සටහනකි.




(i) ඉහත රූප සටහනේ අංක 1 හා 2 කොටස් පිළිවෙළින් නම් කරන්න. (ලකුණු 02)

(ii) (a) අංක 1 හා 2 කොටස් නිර්මාණය වී ඇති මූලික පාෂාණ වර්ග දෙක පිළිවෙළින් ලියන්න.

(b) ශිලාගෝලයට අයත් අංක 03න් දැක්වෙන ස්ථරය නම් කරන්න. (ලකුණු 03)

(iii) ශිලාගෝලයේ ඇති සම්පත් මිනිසා විසින් ප්‍රයෝජනයට ගැනීමේ දී ශිලාගෝලයට සිදු වී ඇති බලපෑම් දෙකක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)

(03) (i) ජෛව ගෝලයේ අන්තර් ක්‍රියාකාරීත්වය පවත්නා ප්‍රධාන උප පද්ධති දෙකක් නම් කරන්න. (ලකුණු 02)


(ii) එම උප පද්ධතිවල ජෛව ගෝලයේ පවත්නා වූ සීමාවන් තුන දක්වන්න. (ලකුණු 03)

(iii) ජෛව ගෝලයේ පැවැත්ම සඳහා මිනිසාගෙන් එල්ල වන බාධක තුනක් දක්වා ඉන් එකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(04) පෘථිවියේ සියලු ම ජීවී පද්ධතිවල පැවැත්ම සඳහා ජලය අවශ්‍ය වේ.

(i) පෘථිවි ගෝලයේ ජලය පවත්නා ආකාර 2ක් ලියන්න. (ලකුණු 02)

(ii) පහත දැක්වෙන්නේ ජලය චක්‍රීය ගමනක යෙදෙන ආකාරය දැක්වෙන රූප සටහනකි. එහි A, B, C යන අවස්ථා තුන නම් කරන්න. (ලකුණු 03)




(iii) වර්තමානයේ ජලයේ ගුණාත්මකභාවය අඩුවීමට බලපාන මිනිස් ක්‍රියාකාරකම් 03ක් දක්වා ඉන් එකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(05) භූමියේ දක්නට ඇති විවිධ විෂමතා ලක්ෂණයන්ට අනුකූලව මිනිස් ක්‍රියාකාරකම් ද හැඩ ගැසී ඇත.


(i) රුසියාවේ හා ඕස්ට්‍රේලියාවේ පිහිටි ප්‍රධාන තැනිතලා බිම් දෙක වෙන වෙන ම දක්වන්න. (ලකුණු 02)

(ii) පෘථිවි පෘෂ්ඨය මත නිර්මාණය වී ඇති ආකාරය අනුව විශේෂිත තැනිතලා බිම් 03ක් දක්වන්න.(ලකුණු 03)

(iii) (a) කඳුකර ප්‍රදේශවල සිදු කරන මානව කටයුතු සීමාවීමට බලපෑ හේතු 2ක් දක්වන්න.

(b) තැනිතලා බිම් ප්‍රදේශ මානව කටයුතු සඳහා හිතකර වී ඇති ආකාරය කරුණු 03කින් දක්වන්න. (ලකුණු 05)

(06) ලෝකයේ දේශගුණ කලාප දැක්වෙන පහත ආදර්ශය ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.




(i) ඉහත ආදර්ශයේ A හා B වලින් දැක්වෙන දේශගුණික කලාප දෙක පිළිවෙලින් නම් කරන්න. (ලකුණු 02)


(ii) (a) A වලින් දැක්වෙන දේශගුණය ව්‍යාප්තව පවතින අක්ෂාංශ පරතරය දක්වන්න.

(b) B හා C කලාපවල ඇති විශේෂිත දේශගුණ වර්ග එක බැගින් පිළිවෙළින් සඳහන් කරන්න. (ලකුණු 03)

(iii) දේශගුණික කලාපවල දක්නට ලැබෙන දේශගුණික ලක්ෂණ කිහිපයක් පහත කොටුවේ දැක්වේ. ඒවා අතරින් A වලින් දැක්වෙන දේශගුණයේ විශේෂිත ලක්ෂණ 3ක් ද B වලින් දැක්වෙන දේශගුණයේ ලක්ෂණ 2ක් ද තෝරා ලියන්න. (ලකුණු 05)

| |
|---|
| * පැහැදිලි උණුසුම් සෘතුවක් ඇත. |
| * වසර පුරා ඉහළ උෂ්ණත්වයක් ඇත. |
| * ශීත සෘතුවක් ඇත. |
| * බොහෝ ප්‍රදේශවලට වසර පුරා අධික වැසි ලැබේ. |
| * තුහිනය හා හිම පතනය ඇතිවෙයි. |
| * තැනින් තැනට ලැබෙන වර්ෂාපතනයේ විවිධ බව ඇත. |

(07) සාගර පත්ලේ භූ ලක්ෂණ සහිත රූප සටහනක් පහත දැක්වේ. ඒ ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.




(i) මහාද්වීපික තටකය යන්න කෙටියෙන් හඳුන්වන්න. (ලකුණු 02)

(ii) රූපසටහනේ අංක 1, 2, 3 න් දැක්වෙන සාගරික ලක්ෂණ නම් කරන්න. (ලකුණු 03)

(iii) (a) ලෝකයේ ගැඹුරුම සාගරික ආගාධය නම් කරන්න.

(b) මිනිසා විසින් සාගරික ප්‍රදේශ ප්‍රයෝජනයට ගන්නා ආකාර දෙකක් දක්වන්න.

(c) සාගර ජල දූෂණයට හේතු වන මිනිස් ක්‍රියාකාරකම් 2ක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(08) (i) ආසියාවේ වී වගාව සිදු කෙරෙන රටවල් දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)

(ii) ආසියාවෙන් බැහැරව වී වගා කරන පහත සඳහන් ප්‍රදේශ අයත් වන රටවල් පිළිවෙළින් ලියන්න.

(a) සැක්‍රමැන්ටෝ නිම්නය -

(b) පෝ ගංගා නිම්නය

(c) මරේඩාලින් නිම්නය (ලකුණු 03)

(ii) (a) ලෝකයේ වී වගාව ආශ්‍රිත ගැටලු දෙකක් ලියන්න.

(b) වී නිෂ්පාදනය ආශ්‍රිත ප්‍රවණතා තුනක් ලියන්න. (ලකුණු 05)

Answer

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**Provincial Department of Education - NWP**

61 S I,II

පළමු වාර පරීක්ෂණය - 10 ශ්‍රේණිය - 2020

# First Term Test - Grade 10 - 2020

භූගෝල විද්‍යාව පිළිතුරු පත්‍රය

## I පත්‍රය

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| (1) | - | මිලියන 510 | (11) | - | නි | (21) | - | B | (31) | - | 97.5% |
| (2) | - | හතරකින් | (12) | - | වැ | (22) | - | C | (32) | - | (3) |
| (3) | - | මෙසෝ | (13) | - | වැ | (23) | - | G | (33) | - | (2) |
| (4) | - | අපධාවය | (14) | - | නි | (24) | - | H | (34) | - | (4) |
| (5) | - | ග්‍රැනයිට් | (15) | - | වැ | (25) | - | D | (35) | - | (4) |
| (6) | - | අප්‍රිකා | (16) | - | 2 | (26) | - | විල් | (36) | - | (3) |
| (7) | - | ප්‍රාවරණය හා හරය | (17) | - | 4 | (27) | - | වාෂ්පීකරණය | (37) | - | (3) |
| (8) | - | හවායි | (18) | - | 1 | (28) | - | මහාද්වීප | (38) | - | (4) |
| (9) | - | ටිබෙට් | (19) | - | 3 | (29) | - | ශිලාගෝලය | (39) | - | (2) |
| (10) | - | පැසිපික් | (20) | - | 3 | (30) | - | පරිවර්තී | (40) | - | (1) |

(නිවැරදි පිළිතුරකට ලකුණු 1 බැගින් ලකුණු 40යි)

## II පත්‍රය

### I කොටස

(01) (අ) (i) A - පිටත වට තීරුව (පහළ කොටස)

B - ඇතුළු මායිම් තීරුව (ලකුණු 2)

(ii) සිතියමේ මුහුණත (ලකුණු 2)

(iii) පරිමාණය, දිශාව, යාබද සිතියම්, සුචිය, පරිපාලන මායිම් දක්වෙන කොටුව ආදිය (ලකුණු 2)

(iv) (1) සිතියම් ප්‍රදේශයේ නම

(2) පත්‍ර අංකය (ලකුණු 2)

(v) ජාල උතුර, සැබෑ උතුර, චුම්භක උතුර (ලකුණු 2)

(ආ)(i) B

(ii) E

(iii) G

(iv) M

(v) Q (ලකුණු 5)

(ඉ) (i) B

(ii) E

(iii) G

(iv) L

(v) P (ලකුණු 5)

### II කොටස

(02) (i) 1 - මහාද්වීපික කබොල

2 - සාගරික කබොල (ලකුණු 2)

(ii) (a) ග්‍රැනයිට් පාෂාණ

බැසෝල්ට් පාෂාණ

(b) ඉහළ ප්‍රාවරණය (ලකුණු 3)

(iii)
- භූමි නාය යාම
- පංශු ඛාදනය
- මතුපිට භූ දර්ශන වෙනස්වීම
- අපද්‍රව්‍ය බැහැර කිරීම
- තට්ටු ගොඩනැඟිලි නිසා සමබරතාවය නැති වීම (2 පිටුව) (ලකුණු 5)

(03) (i) ශිලා ගෝලය, වායු ගෝලය, ජල ගෝලය (ලකුණු 2)

(ii) ශිලා ගෝලය - ශාකවල මුල් විහිදෙන හා පාංශු ජීවින් වෙසෙන කොටස

ජල ගෝලය - ප්‍රභාසංස්ලේෂණය සඳහා අවශ්‍ය හිරුඑළිය ලැබෙන සාගර පතුල් සීමාව

වායුගෝලය - පක්ෂීන් පියාසර කරන සීමාව (ලකුණු 3)

(iii)
- වනාන්තර විනාශ කිරීම

- ජෛව පද්ධති විනාශ කිරීම
- මතුපිට පස සේදී යාම
- අනවසර ඉදි කිරීම්
- බෑවුම් ප්‍රදේශ එළි කිරීම
- වන සතුන් විනාශ කිරීම වැනි සාධක තුනක් දක්වීමට ලකුණු 3, පැහැදිලි කිරීමට ලකුණු 2 (ලකුණු 5)

(04) (i) ඝන, ද්‍රව, වායු (ලකුණු 2)

(ii) A - වාෂ්පීකරණය - ජලාශවලින් ජලය වායුගෝලයට එක්වීම.

B - උත්ස්වේදනය - ශාක පත්‍රවලින් හා පසේ ජලය වායුගෝලයට එක් වීම.

C - වර්ෂණය - ජලය පොළොවට පතිත වීම. වැනි අදාළ කරුණු විස්තර කිරීමට ලකුණු ලබා දෙන්න. (ලකුණු 3)

(iii)
- කර්මාන්ත සඳහා යොදා ගන්නා ජලය අපවිත්‍ර ලෙස පිට කිරීමේදී විවිධ රසායනික හා කාබනික ද්‍රව්‍ය ජලයට එක්වීම.
- කෘෂි කර්මාන්තයේ දී පසට එකතු කරන පොහොර වර්ග කෘෂි රසායන ද්‍රව්‍ය ජලය සමඟ මිශ්‍ර වීම.
- මළ අපවහනය නිසා මතුපිට ජලයට සහ භූගත ජලයට අපද්‍රව්‍ය එකතු වීම.

කරුණු 3 දක්වීමට ලකුණු 3 පැහැදිලි කිරීමට ලකුණු 2 (ලකුණු 5)

(05) (i) රුසියාව - මහා සයිබීරියානු තැන්න

ඕස්ට්‍රේලියාව - නල්ලබාර් තැන්න (ලකුණු 2)

(ii) වෙරළබඩ තැන්න, ග්ලැසියර් තැන්න, ගංගා තැන්න (ලකුණු 3)

(iii) (a) රළු භූවිෂමතාව, කටුක දේශගුණය, පිවිසීමට අපහසු වීම ආදිය

(b) වගාවන් සඳහා, සත්ව පාලනයට ජනාවාස ඉදිකිරීම, මාර්ග ඉදිකිරීම වැනි අදාළ කරුණු 3කට ලකුණු ලබා දෙන්න. (ලකුණු 5)

(06) (i) (a) A - නිවර්තන කලාපය

B - සෞම්‍ය කලාපය (ලකුණු 2)

(ii) (a) උතුරු අක්ෂාංශ 23 $1/2^0$ හා

දකුණු අක්ෂාංශ 23 $1/2^0$

(b) B - මධ්‍යධරණී දේශගුණ

C - තුන්ද්‍රා දේශගුණ (ලකුණු 3)

(iii) A -
- වසර පුරා ඉහළ උෂ්ණත්වයක් ඇත.
- බොහෝ ප්‍රදේශවලට වසර පුරා අධික වැසි ලැබේ.
- තැනින් තැනට ලැබෙන වර්ෂාපතනයේ විවිධ බව ඇත.

B - ශීත ඍතුවක් ඇත.

පැහැදිලි උණුසුම් ඍතුවක් ඇත.

(ලකුණු 5)

(07) (i) මහාද්වීපික මායිමේ සිට සාගරය දෙසට පැතිරී ගිය නොගැඹුරු මුහුදු තීරය (ලකුණු 2)

(ii) 1- මහාද්වීපික බෑවුම 2- ද්‍රෝණිය 3- ආගාධය (ලකුණු 3)

(iii) (a) මරියානා

(b) ප්‍රවාහනය, ධීවර කර්මාන්තයට, සංචාරක කර්මාන්තය

(c) තෙල් ගවේෂණ, අපද්‍රව්‍ය බැහැර කිරීම, න්‍යෂ්ටික අත්හදා බැලීම් අදාළ පිළිතුරුවලට ලකුණු ලබා දෙන්න. (ලකුණු 5)

(08) (i) ඉන්දියාව, ශ්‍රී ලංකාව, මියන්මාරය, තායිලන්තය (ලකුණු 2)

(ii) (a) ඇමරිකා එක්සත් ජනපදය,

(b) ඉතාලිය

(c) ඕස්ට්‍රේලියාව (ලකුණු 3)

(iii) (a) ඉඩම් කැබලි වීම, අස්වැන්න අඩුවීම ආදිය

(b) යාන්ත්‍රීකරණය, රසායනික පොහොර භාවිතය, වැඩි දියුණු කළ බීජ යොදා ගැනීම ආදිය

(ලකුණු 5)